# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No . | දිනය<br>திகதி<br>Date. 2024 . 09 . 12 |

1. එච්. ඒ. චන්ද්‍රිකා මිය
   නො. 25, පඤ්ඤාසිංහ මාවත,
   මඩිහ, මාතර.

*පැමිණිලි පාර්ශවය*

2. චදූල් ලක්විද ජයසිංහ (ශිෂ්‍යයා)

*අගතියටපත් පාර්ශවය*

එදිරිව

1. සමිත කුරුකුලසූරිය මිය
   විදුහල්පති,
   රාහුල විද්‍යාලය, මාතර

2. ලේකම්
   අධ්‍යාපන අමාත්‍යාංශය,
   ඉසුරුපාය, බත්තරමුල්ල.

3. විභාග කොමසාරිස් ජනරාල්
   විභාග දෙපාර්තමේන්තුව,
   පැලවත්ත, බත්තරමුල්ල.

*වගඋත්තර පාර්ශවය*

<u>පැමිණිලි අංකය</u> : **<u>HRC/MTR/SUO/MOTU/03/24/M, HRC/MTR/200/24/M,</u>**
**<u>HRC/HO/2554/24</u>**

**පැමිණිල්ල :-**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් "අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයට පැමිණි දරුවාට බාධා කිරීම" යන මැයෙන් සමාජ මාධ්‍ය මගින් සිදුකරන ලද අනාවරණයට අදාළව HRC/MTR/SUO/MOTU/03/24/M යටතේ පැමිණිල්ලක් 2024.05.21 දින ආරම්භ කරන ලදි. පසුව ඉහත පැමිණිලිකාරිය විසින් 2024.06.03 දිනැතිව මාතර ප්‍රාදේශීය කාර්යාලය


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද. මෙල් මාවත කොළඹ -04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04. / No. 14, R.A.De Mel Mawatha, Colombo -04.
සභාපති / தவிசாளர் / Chairman: 011- 2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011- 2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 /82
ලේකම් / செயலாளர் / Secretary: 011- 2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

වෙත ලිඛිත පැමිණිල්ලක් ඉදිරිපත් කළ බැවින් එය HRC/MTR/200/24/M යටතේ ලියාපදිංචි කරන ලදි. ඉහත පැමිණිලි අංක දෙක යටතේ මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් පැමිණිලි පාර්ශවයෙන් සහ වින්දිත පාර්ශවයෙන් ප්‍රකාශ සටහන් කර ගැනීම සිදුකර ඇති අතර, වගඋත්තර පාර්ශවය ලෙස විදුහල්පති - රාහුල විද්‍යාලය සහ විෂය ගත සිදුවීමට අදාළ විභාග ශාලාධිපති වෙතින් ද ප්‍රකාශ සටහන් කර ගන්නා ලදි. එමෙන්ම 2024.05.31 දිනැතිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය වෙත මෙම සිදුවීමට අදාළව නිර්ණාමිකව ලිඛිත පැමිණිල්ලක් යොමුකර තිබූ බැවින් HRC/HO/2554/24 යටතේ එම පැමිණිල්ල ලියාපදිංචි කර ප්‍රධාන කාර්යාලය විසින් ඊට අදාළ විමර්ශන කටයුතු ආරම්භ කරන ලදි. ඒ සඳහා මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් සිදුකරන ලද විමර්ශන වාර්තා ද ප්‍රධාන කාර්යාලය වෙත කැඳවා, මේ පිළිබඳ වැඩිදුර විර්ශන කටයුතු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය හරහා සිදුකරන ලදි.

මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් පැමිණිල්ලට අදාළව ලබාගන්නා ලද ප්‍රකාශ සටහන් පහත පරිදි වේ.

1. පැමිණිලිකරු - එච්. ඒ. චන්ද්‍රිකා මිය

පැමිණිලිකාරිය වන එච්.ඒ. චන්ද්‍රිකා මිය 2024.06.04 දින මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත ප්‍රකාශයක් ලබාදෙමින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කර ඇත. තමා සිය සැමියා සමග 2024.05.06 දින පෙ.ව. 7.40 ට පමණ තමාගේ විශේෂ අවශ්‍යතා සහිත වදුල් ලක්විද ජයසිංහ දරුවා සමඟ සාමාන්‍ය පෙළ විභාගයට මුහුණදීම සඳහා මාතර රාහුල විද්‍යාලයට ගිය අවස්ථාවේදී විද්‍යාලයෙන් පිටත ගේට්ටුව අසල රාහුල විද්‍යාලයේ විදුහල්පතිනි සමිත කුරුකුලසූරිය මහත්මිය සිටි බවත්, විභාගයට මුහුණදීම සඳහා පාසලට ඇතුළුවන දරුවන් ඇය අසලට කැඳවා ඇයට වන්දවා ගත් බව දුටු බවත් පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත. තමාගේ විශේෂ අවශ්‍යතා සහිත දරුවාටත් විදුහල්පතිනිය විසින් වදින ලෙස ප්‍රකාශ කර ඇති අතර දරුවා ඇයට වැන්ද පසු, දරුවා සමග තමන්ට පාසල තුළට පිවිසීමට නොහැකි බව විදුහල්පතිනිය විසින් ප්‍රකාශ කළ බව පැමිණිලිකාරිය සඳහන් කර ඇත. තම දරුවා විශේෂ අවශ්‍යතා සහිත දරුවෙක් වන බැවින් විභාග දෙපාර්තමේන්තුව විසින් තමාට දරුවා සමග විභාග මධ්‍යස්ථානයට ඇතුළුවීම සඳහා අවසර පත්‍රයක් ලබාදී ඇති බව විදුහල්පතිනියට ප්‍රකාශ කර, අදාළ අවසර පත්‍රය විදුහල්පතිනිය වෙත පෙන්වූ පසු ද එම අවසර පත්‍රය පරික්ෂා කිරීමෙන් අනතුරුව තමාට දරුවා සමග පාසල තුළට පිවිසීමට නොහැකි බව දැන්වූ බව සඳහන් කර ඇත. එහිදී විදුහල්පතිනිය වැඩිදුරටත්, "අර ළමයින්ටත් A 9 ගන්න බැරි වෙයි ඔයගොල්ලො ගියොත්" යනුවෙන් ප්‍රකාශ කළ බව පැමිණිලිකාරිය ප්‍රකාශ කර ඇත. පසුව ගේට්ටුව අසල සිටි මුරකරුහට ද තමාට අවසර ලිපියක් ඇති බවත්, දරුවා සමඟ පාසල තුළට යාමට අවස්ථාව ලබාදෙන ලෙසට ඉල්ලීම් කළ බව ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී මුරකරු කිසිවක් ප්‍රකාශ කර නොමැත. පසුව තම දරුවා විභාගයට වාඩිකරවිය යුතු හෙයින් දරුවා සමග පාසල තුළට ඇතුළුවීමට උත්සාහ කළ බවත්, එම අවස්ථාවේදී විදුහල්පතිනිය ඊට තදින් විරුද්ධ වූ බැවින් දරුවා බියට පත් වූ බවත්, දරුවා පමණක් පාසල තුළට යැවීමට නොහැකි බැවින් සිය සැමියා දරුවා සමග පාසල තුළට

යැවීමට සූදානම් වීමේදී නැවත විදුහල්පතිනිය විසින් දරුවා තනියම පාසල තුළට යවන ලෙස ඉතා තදින් ප්‍රකාශ කළ බැවින් ඊට බිය වූ දරුවා අවසර ලිපියත් රැගෙන පාසලේ ක්‍රීඩා පිටිය දෙසට දිව ගිය බවත් පැමිණිලිකාරිය විසින් ප්‍රකාශ කර ඇත.

ඉන් පසු විදුහල්පතිනිය විසින් පාසලේ ගේට්ටුව අසලදී දිගින් දිගටම තමාට හා සැමියාට බැනවැදුණු බවත්, තමා විසින් කලාප කාර්යාලයට සහ විභාග දෙපාර්තමේන්තුවට දුරකථනයෙන් ඇමතූ බවත් ප්‍රකාශ කර ඇත. පසුව රාහුල විද්‍යාලයේ ශාලාධිපතිතුමා වෙත ලද පණිවිඩයකට අනුව පාසලේ ගේට්ටුව අසලට පැමිණ ඇති අතර විදුහල්පතිනිය විසින් ශාලාධිපති වෙත ද බැණ වැදුණු බව පැමිණිලිකාරිය සඳහන් කර ඇත. ශාලාධිපති විසින් ලිපියේ සඳහන් කරුණු අනුව දෙමව්පියන්ට පාසල තුළට ඇතුළුවීමට හැකි බව ප්‍රකාශ කරමින් විදුහල්පතිනිය සමග තර්ක කිරීමෙන් පසු ශාලාධිපතිතුමාගේ දැඩි මැදිහත්වීම මත දරුවාගේ පියාට පාසල තුළට පිවිසීමට අවස්ථාව සලසාගැනීමට හැකිවී ඇත. පසුව තමා මාතර පොලිස් ස්ථානයට ගොස් පැමිණිල්ලක් සිදුකළ නමුත් මෙම ප්‍රකාශ ලබාදෙන දිනය වන තෙක් (2024.06.04) විමර්ශනයක් සිදු නොකළ බවත් ප්‍රකාශ කර ඇත. පැමිණිලිකාරිය විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, මෙම සිදුවීම හේතුවෙන් තම දරුවා අඩු අවධානය සහිත දරුවෙක් වන බැවින් නැවත පාසල් යැවීමේ ගැටලුවක් පවතින බවත්, විදුහල්පතිනියගේ ක්‍රියාකලාපය හේතුවෙන් සිය පවුල අපහසුතාවයට පත්ව ඇති බවත් ය. එමෙන්ම තමාට අවශ්‍ය වන්නේ තම දරුවාට අපහසුතාවයකින් තොරව විද්‍යාලයේ අධ්‍යාපන කටයුතු කරගෙන යාමට අවශ්‍ය වාතාවරණය සකසා ගැනීමට සහ මෙම සිදුවීම හේතුවෙන් සිය දරුවාට නිරවුල් මානසිකත්වයෙන් විභාගයට මුහුණදීමට බැරිවූ බැවින් විදුහල්පතිනියගේ මෙම ක්‍රියාකලාපයට විරුද්ධව සාධාරණයක් ඉටුකර ගැනීමත් බව ප්‍රකාශ කර ඇත.

**2. අගතියටපත් පාර්ශවය - වදූල් ලක්විද ජයසිංහ (ශිෂ්‍යයා - වයස අවු.16)**

අගතියටපත් පාර්ශවය වන වදූල් ලක්විද ජයසිංහ ශිෂ්‍යයා විසින් 2024.07.23 දින මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත ප්‍රකාශයක් ලබාදෙමින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කර ඇත. 2024.05.06 දින තමා සාමාන්‍ය පෙළ විභාගය ලිවීම සඳහා රාහුල විද්‍යාලයට ගිය අතර, පාසලට යන අවස්ථාවේදී රාහුල විද්‍යාලයේ විදුහල්පතිනිය ගේට්ටුව අසල රැඳී සිටි ඇත. විභාගය සඳහා පැමිණෙන සෑම සිසුවෙක්ටම ඇයට වදින ලෙස විදුහල්පතිනිය ප්‍රකාශ කළ බව ශිෂ්‍යයා ප්‍රකාශ කර ඇත. එම අවස්ථාවේදී තමා සහ සිය මව පාසල තුළට ඇතුළුවීමට යන විට විදුහල්පතිනිය විසින් සිය මවට "තමුසෙ විභාග ශාලාවට යන්න එපා. මේකට ඇති ලෙඩක් නෑ. දෙනවා ලියුම දරුවට" යනුවෙන් ප්‍රකාශ කරමින් තමාව තනිව පාසල තුළට යැවූ බව ප්‍රකාශ කර ඇත. ඉන් පසු තමා ක්‍රීඩා පිටිය දෙසට දිවගිය බවත් තමා අධික ලෙස බියට පත්වී සිටි බවත් පාසලේ සිටි සිසුන් තමාට සිනාසුණු බවත් ප්‍රකාශ කර ඇත. පසුව ශාලාවේ පිටුපස සිටි ගුරුවරයෙක් වෙතින් තමා සිටිය යුත්තේ කුමන ස්ථානයේද යන්න විමසා ඇති අතර, එම ස්ථානයට පැමිණි රෝයි නැමති ගුරුවරයා තමා තවත් ගුරුවරයෙක් වෙත යොමුකළ බවත්, එම ගුරුවරයා විසින් තමා පන්ති කාමරයේ වාඩිකරවූ බවත් ප්‍රකාශ කර ඇත. තම මවට තමා සමග පාසලට

ඇතුළුවීමට ඉඩනොදුන් හෙයින් තමා අධික ලෙස බියට පත්වී කලබලයට පත්වී සිටි බවත් යහළුවන් තමාට සිනාසුණු බවත්, මෙම සිදුවීම හේතුවෙන් ඇතිවූ මානසික පීඩනය හේතුවෙන් තමාට විභාගයට නිසියාකාරව මුහුණදීමට නොහැකි වූ බවත් ප්‍රකාශ කර ඇත. එදින මෙම සිදුවීම සිදුනොවුනා නම් තමාට සිය මව සමග විභාගයට යාමට හැකියාව තිබූ බවත්, මෙම සිදුවීම මත සිය පියා සමග විභාගයට යාමට සිදුවූ බවත් තමාගේ කැමැත්ත තිබුණේ මව සමග විභාගයට යාමට බවත් විදුහල්පතිතුමියගේ ක්‍රියාකලාපය හේතුවෙන් තමාට මව සමග යාමට නොහැකි වූ බවත්, මෙවැනි සිදුවීමක් සිදුනොවුනා නම් තමාට විභාගයට හොඳින් මුහුණදීමට හැකියාව තිබූ බවත් ශිෂ්‍යයා විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

1. වන වගඋත්තරකරු - සමිත කුරුකුලසූරිය මිය (විදුහල්පති - රාහුල විද්‍යාලය)

පළමු වන වගඋත්තරකරු වන සමිත කුරුකුලසූරිය මිය (විදුහල්පති - රාහුල විද්‍යාලය) විසින් 2024.07.02 දින මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත ප්‍රකාශයක් ලබාදෙමින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කර ඇත. තමා 2024.05.06 දින සාමාන්‍ය පෙළ විභාගය ආරම්භ කළ පළමු දින සාමාන්‍ය පරිදි දරුවන්ට ආශිර්වාද කිරීමට පාසලෙන් පිටත ගේට්ටුව ආසන්නයේ සිටි බව ප්‍රකාශ කර ඇත. එදින පෙ.ව. 6.45 පමණ සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින හිරුෂ පන්සිලු දරුවා තමා ළඟට පැමිණ තමාට වැද, විභාග කාලයේදී වදුල්ගේ අම්මලාගෙන් කරදරයක් වේවිද යනුවෙන් විමසූ බවත්, තමා එම දරුවාට බිය නොවන ලෙසත් වදුල්ගේ මවට පාසලට ඇතුළුවීමට ලිපියක් නොමැති බවත්, එබැවින් වදුල්ගේ මව විභාග ශාලාවට නොපැමිණෙන බවත්, විභාගයට යන එන වෙලාවට වදුල්ගෙන් හෝ වදුල්ගේ මවගෙන් යම් බලපෑමක් සිදු වුවහොත් ශාලාධිපතිට දැනුම්දෙන ලෙස උපදෙස් ලබාදුන් බවත් ප්‍රකාශ කර ඇත. තමා විසින් හිරුෂ පන්සිලු ශිෂ්‍යයාහට එවැනි උපදෙසක් ලබාදෙනු ලැබුවේ, ඒවන විටත් වදුල්ගේ මව විසින් හිරුෂ පන්සිලු ශිෂ්‍යයා සම්බන්ධයෙන් සිදුකරන ලද පැමිණිල්ලක් විභාග වෙමින් පවතින බැවින්, එම දරුවා බියෙන් සිටින බව දැනගත් බැවින්යැයි සඳහන් කර ඇත. මේ අවස්ථාවේදී ITN මාධ්‍යයේ වාර්තාකරුවෙකු පාසල ඉදිරිපිටට පැමිණ සිටි අතර, සාමාන්‍ය පෙළ විභාගයට මුහුණදෙන දරුවන්ට සුභපැතුම් පණිවිඩයක් ලබාදීමට අවස්ථාවට තමාට වාර්තාකරු විසින් ලබාදුන් නමුත් ඊට අමාත්‍යාංශයෙන් අවසරයක් නොතිබූ බැවින් තමා එය ප්‍රතික්ෂේප කළ බවත් සඳහන් කර ඇත.

පෙ.ව. 8.00 පමණ වදුල් සහ වදුල්ගේ දෙමව්පියන් මුරකරුට කෑ ගසමින් විභාග භූමියට ඇතුලු වූ බවත්, මුරකරු විසින් ඒ පිළිබඳව තමාට දැන්වූ පසු තමා එම අවස්ථාවේදී පාසල් මුරකරුට කතා කොට දරුවා මුලින්ම විභාග ශාලාවට පිටත් කළ බවත් ඊට පසු වදුල්ගේ දෙමව්පියන් තමා සමග ගැටුමක් ඇතිකර ගත් බවත් ප්‍රකාශ කර ඇත. දෙමාපියන් විසින් ඔවුන්ට ඇතුළට යාමට අවසර ඇති බවට ප්‍රකාශ කළ බැවින් තමා විසින් අවසර ලිපිය ඉල්ලා සිටි බවත්, ඔවුන් විසින් 2024.04.29 දිනැතිව ලබාදුන් අවසර ලිපිය තමාට ලබාදුන් බව සඳහන් කර ඇත. එම ලිපියෙහි අයදුම්කරු අසුන්ගැන්වීමට දෙමව්පියන්ට අවසර ලබාදී නොමැති අතර, දරුවා වෙත විශේෂ වරප්‍රසාදයක් ලබාදී ඇති බවට එම ලිපියෙහි නොතිබූ බවත් විදුහල්පතිනිය විසින් ප්‍රකාශ කර ඇත. එබැවින් එම ලිපියට අදාළව පාසල තුළට ඇතුළුවීමට

අවසර ලබාදිය නොහැකි බව ඔවුන් වෙත දැනුම්දුන් බවත් මෙම ගැටලුව ඇතිවන අවස්ථාවේදී තමා විභාග ශාලාධිපතිට පැමිණෙන ලෙස දැනුම්දුන් බවත් එහෙත් ගැටුම ඇතිවන තෙක්ම ශාලාධිපති නොපැමිණි බවත් සඳහන් කර ඇත. තමා නැවත වරක් විභාග සම්බන්ධීකරණ නිලධාරී ආරුක්ක ආදර්ශ විද්‍යාලයේ විදුහල්පති ජගත් මයා මගින් විමසුමක් කළ බවත්, විශේෂ වරප්‍රසාද සම්බන්ධ දරුවා පිළිබඳ පණිවිඩයක් ලැබුණේදැයි විමසූ විට එතුමා විසින් එවැනි දැනුම්දීමක් නොමැති බව ප්‍රකාශ කළායැයි සඳහන් කර ඇත. පසුව විභාග ශාලාධිපති එම ස්ථානයට පැමිණි බවත් වදූල් දරුවාගේ දෙමව්පියන් පාසල තුළට බලෙන් ඇතුළුවීමට උත්සාහකරන බව තමා ශාලාධිපතිට දැනුවූ පසු ශාලාධිපති ළඟ 2024.04.30 දිනැතිව ලිපියක් තිබූ බවත්, එම ලිපිය අනුව දෙමව්පියන්ට අයදුම්කරු සිටින ස්ථානය තුළ රැඳී සිටි හැකි බව සඳහන්ව තිබූ බැවින් ලිපිය අනුව දරුවා සමග පාසලට ඇතුළු වන්නේ කවුරුන්ද යන්න විභාගශාලාධිපති විසින් තීරණය කරන බැවින් ශාලාධිපති ඒ පිළිබඳව තමාගෙන් විමසා සිටි බවත් ප්‍රකාශ කර ඇත. එවිට තමා විසින් ඉහත සඳහන් කළ හිරුෂ පන්සිලු දරුවාට වදූල්ගේ මව නිරන්තරයෙන් බලපෑම් කරන බැවින් විභාග පරිශ්‍රයට ඇතුළුවීම සඳහා වදූල්ගේ පියාගේ නම තමා යෝජනා කළ බවත් ඒවන විට වදූල්ගේ මව විභාග වංචාවක් සිදු කිරීමට සූදානමක් ඇති බවට ඔත්තුවක් ලැබී තිබූ බැවින් මෙම සිදුවීම් සම්බන්ධයෙන් යම් ගැටලුවක් උද්ගත වුවහොත් එහි වගකීම ශාලාධිපති විසින් ලබාගත යුතු බව දැනුම්දුන් බවත් විදුහල්පතිනිය විසින් ප්‍රකාශ කර ඇත. පැමිණිල්ලේ සඳහන් පරිදි තමා විභාගයට යාම වැළැක්වීමක් නොකළ බවත් දරුවා සමඟ පුද්ගලික ගැටලුවක් නොමැති බවත් වැඩිදුරටත් විදුහල්පතිනිය විසින් ප්‍රකාශ කර ඇත.

මාරතුඩුගේ රෝයි මයා (ශාලාධිපති) ගේ ප්‍රකාශය :

මෙම විෂයගත සිදුවීම සිදුවූ දින රාහුල විදුහලේ විභාග ශාලාධිපති ලෙස රාජකාරී ඉටුකරන ලද මාරතුඩුගේ රෝයි මයා (ශාලාධිපති) විසින් 2024.07.17 දින මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත ප්‍රකාශයක් ලබාදෙමින් පහත සඳහන් කරුණු ඉදිරිපත් කර ඇත. 2024.05.06 දින සාමාන්‍ය පෙළ විභාගයේ ආරම්භක දවස වූ අතර තමා රාහුල විදුහලේ විභාග ශාලා අංක 02 හි ශාලාධිපති වශයෙන් කටයුතු කළ බව ප්‍රකාශ කර ඇත. මෙදින විභාග කටයුතු සඳහා තමා රාහුල විද්‍යාලයට පෙ.ව. 7.00 පමණ වාර්තා කළ බවත්, පෙ.ව. 8.15 පමණ විශේෂ අවශ්‍යතා ඇති දරුවකුගේ දෙමාපියන්ට පාසලට ඇතුලුවීමට අවසර නොදීම සම්බන්ධයෙන් කලාප කාර්යාලයෙන් ලද දැනුම්දීමකට අනුව පාසලේ ගේට්ටුව ගොස් ඇත. එම අවස්ථාවේදී යම් කාන්තාවක් සහ පිරිමි පුද්ගලයෙකු සමග රාහුල විද්‍යාලයේ විදුහල්පතිතුමිය බහින්බස්වීමක් සිදුවන බව තමාට නිරීක්ෂණය වූ බවත් එම අවස්ථාවේදී මෙම ගැටලුව විශේෂ අවශ්‍යතා ඇති දරුවා සම්බන්ධ ගැටලුව බව තමාට පැහැදලි වූ බවත් ප්‍රකාශ කර ඇත. තමා එම ස්ථානයට පැමිණෙන විට විදුහල්පතිනිය එම දරුවාගේ දෙමව්පියන්ට පාසලට ඇතුළුවීමට අවසරදී නොතිබූ බවත් එම අවස්ථාවේදී තමා සතුව තිබූ විභාග දෙපාර්තමේන්තුවෙන් ලබාදී තිබූ අවසර පත්‍රය විදුහල්පතිනියට පෙන්වූ බව ප්‍රකාශ කර ඇත. තවද මෙම විශේෂ අවශ්‍යතා සහිත දරුවා විභාගයට පෙනී සිටින බවට ගේට්ටු මුරකරුට දන්වා ඇති බවත්, මෙම ලිපිය විභාග දෙපාර්තමේන්තුව විසින්

දෙමව්පියන්ට ද ලබාදී ඇති බවත් ප්‍රකාශ කර ඇත. තමා පමණක් නොව විභාග සම්බන්ධීකරණ කටයුතු නිලධාරියා විසින් ද මුරකරු වෙත විශේෂ අවශ්‍යතා සහිත දරුවෙකු විභාගයට පෙනී සිටීමට පැමිණෙන බව දැනුවත් කර තිබූ බව වැඩිදුරටත් සඳහන් කර ඇත. පසුව අදාළ ලිපිය පෙන්වා තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව දරුවාගේ පියා විභාග ශාලා පරිශ්‍රය වෙත රැගෙන ගිය අතර මෙම සිදුවීම සිදුවන අවස්ථාවේදී විදුහල්පතිතුමිය තමා සමග ද බහින්බස්වීමක් සිදු වූ බව ශාලාධිපති විසින් ප්‍රකාශ කර ඇත. තමා විසින් අවසර ලිපියෙහි දක්වා ඇති විධිවිධාන අනුව සියලු පහසුකම් විභාග අපේක්ෂකයාට ලබාදී ඇත. ශාලාධිපති විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, ආබාධිත දරුවාගේ දෙමාපියන්ට විභාග මධ්‍යස්ථානයට ඇතුළුවීමට ඉඩනොදීම සහ විදුහල්පතිනිය විසින් විභාග කොමසාරිස් ජනරාල් මගින් 2024.04.30 දිනැතිව නිකුත් කරන ලද ලිපියට අනුව ක්‍රියා නොකිරීම හේතුවෙන් තමාගේ කාර්යය භාරයට අනවශ්‍ය මැදිහත්වීමක් සිදුකළ බවත්, එමගින් මෙම දරුවාගේ දෙමව්පියන්ට අසාධාරණයක් සිදුවූ බවයි.

02 වන වගඋත්තර පාර්ශවය - ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය)

2024.07.31 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද විභාගය සඳහා ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය) වෙනුවෙන් පෙනී සිටින ලද එම්. සී. පලාවෙල මිය - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) විසින් මෙකී සිදුවීමට අදාළව පහත කරුණු ප්‍රකාශ කර ඇත. මෙම පැමිණිල්ල විභාග කටයුත්තක් සම්බන්ධයෙන් වූ සිදුවීමක් වන හෙයින් මේ පිළිබඳව කටයුතු කරනු ලබන්නේ විභාග දෙපාර්තමේන්තුව වන බවත්, මේ සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය මැදිහත් නොවන බවත් ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත ලැබුණු පැමිණිල්ලට අනුව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධීක්ෂණ ගොනුවට මෙම පැමිණිල්ල ඇතුළත් කර ඇති බවත් 2024.08.01 දිනට මේ පිළිබඳව සාකච්ඡාවක් පැවැත්වීමට නියමිතව ඇති බැවින් එකී සාකච්ඡාවේදී ගන්නා තීරණ අනුව විධිමත් පරීක්ෂණයක් කලාප මට්ටමින් පවත්වන්නේද යන්න පිළිබඳව තීරණය කරනු ලබන බවත් එතුමිය විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත.

03 වන වගඋත්තර පාර්ශවය - විභාග කොමසාරිස් ජනරාල් (විභාග දෙපාර්තමේන්තුව)

2024.07.31 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද විභාගය සඳහා විභාග කොමසාරිස් ජනරාල් (විභාග දෙපාර්තමේන්තුව) වෙනුවෙන් පෙනී සිටින ලද බී.එන්.එස්. අතුකෝරළ මහතා - නියෝජ්‍ය විභාග කොමසාරිස් (පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල) විසින් මෙකී සිදුවීමට අදාළව පහත කරුණු ප්‍රකාශ කර ඇත. “මෙම සිදුවීමට අදාළව ලිඛිත පැමිණිල්ලක් විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැත. 1968 අංක 25 දරණ පොදු විභාග පනතෙහි බලතල අනුව විභාග සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්වරයාට පූර්ණ බලතල ලැබී ඇත. විභාගයකදී සිදුවන සාමාන්‍ය ක්‍රියාවලිය

පහත පරිදි වේ. පාසල වෙතින් විභාගය පැවැත්වීමට මාස කිහිපයකට පෙර ඉල්ලුම් පත්‍ර කැඳවීම සිදුකරනු ලබයි. එහිදී විශේෂ අවස්ථා සහිත ශිෂ්‍යයින් සිටී නම් ඒ පිළිබඳව අදාළ ඉල්ලුම් පත්‍රවල සඳහන් කර විදුහල්පති විසින් විභාග දෙපාර්තමේන්තුවට යොමු කරනු ලබයි. මෙම තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කළ පසු, මේ පිළිබඳව තොරතුරු රැස්කිරීම සඳහා පත්කරන ලද විශේෂ අවශ්‍යතා පිළිබඳව අවබෝධයක් සහිත නිලධාරි විසින් අදාළ තොරතුරු දත්ත පද්ධතියෙන් ලබාගෙන වාර්තා කිරීම සිදුකරනු ලබයි. පසුව එම දරුවන් සියලුමදෙනා සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර එහිදී වෛද්‍ය වාර්තා ද පරීක්ෂා කරනු ලබයි. එහිදී විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සම්බන්ධයෙන් අවසන් තීරණය ගනු ලබන්නේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් වන අතර, ඒ සඳහා වෛද්‍ය වාර්තා සහ පාසලේ විදුහල්පතිගේ නිර්දේශ උපයෝගී කරගනු ලබයි. මෙකී ක්‍රියාවලියෙන් පසු අදාළ වාර්තා විභාග දෙපාර්තමේන්තුව වෙත ලැබුණු පසු විභාග කොමසාරිස් ජනරාල්තුමා විසින් නැවත වරක් විශේෂඥ දැනුම සහිත නිලධාරීන් දෙදෙනෙකුගෙන් යුත් සමාලෝචන කමිටුවක් දෙපාර්තමේන්තු මට්ටමින් පත් කරනු ලබන අතර, එකී සමාලෝචන කමිටු නිර්දේශ අනුව, විශේෂ අවශ්‍යතා සහිත සියලුම විභාග අයදුම්කරුවන් වෙත සහ ශාලාධිපතිවරු වෙත ලිඛිතව දැනුම්දීමක් සිදුකරනු ලබයි. එම ලිපියෙහි සඳහන් කරන ලද අවශ්‍යතා අදාළ දරුවා වෙනුවෙන් සලසාදීමට ශාලාධිපති විසින් කටයුතු කළ යුතු වේ. මෙය විශේෂ අවශ්‍යතා සහිත දරුවන් විභාගයට පෙනී සිටීම සඳහා සිදුකරනු ලබන සාමාන්‍ය ක්‍රියාවලිය වේ. මෙකී ක්‍රියාවලිය තුළ සම්පූර්ණ බලයලත් නිලධාරියා විභාග කොමසාරිස් ජනරාල්වරයා වේ. අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත හෝ මේ පිළිබඳව බලයක් නොමැත. විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු මෙකී බලය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහ ශාලාධිපති වෙත ලබාදී ඇත. විභාග මධ්‍යස්ථානයේදී ශාලාධිපති හැර කිසිදු නිලධාරියෙකු වෙත බලයක් නොමැති අතර විභාගය පැවැත්වෙන අවස්ථාවේදී පාසලේ විදුහල්පතිට එම ස්ථානයේ රැදී සිටීමට අවසර නොමැත" යනුවෙන් බී.එන්.එස්. අතුකෝරළ මහතා - නියෝජ්‍ය විභාග කොමසාරිස් (පාසල් විභාග සංවිධාන හා ප්‍රතිඵල) විසින් කොමිෂන් සභාව වෙත ප්‍රකාශ කර ඇත.

**සාක්ෂි විමසීම :**

මෙකී පැමිණිල්ල සම්බන්ධයෙන් 2024.07.31 දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද විභාගය අනුව අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් විමර්ශනයට අදාළ වාර්තාවක් කැඳවන ලදි. ඒ අනුව අමාත්‍යාංශය විසින් 2024.08.15 දිනැතිව ED/1/6/12/HRC/2024/19 යොමු අංක යටතේ, රාහුල විදුහලේ මුරකරු සහ චඳුල් ලක්විද ශිෂ්‍යයාගේ පන්තිභාර ගුරුවරිය වෙතින් ලබාගන්නා ලද ප්‍රකාශය ඇතුළත් වාර්තාවක් කොමිෂන් සභාව වෙත යොමුකර ඇත. එම වාර්තාවෙහි දක්වා ඇත්තේ, මෙම සිදුවීම විභාග රාජකාරී වලට අදාළව මතුවූ ගැටලුකාරී තත්ත්වයක් වන බැවින්, මේ සම්බන්ධව විධිමත් විමර්ශනයක් සිදුකිරීමේ පූර්ණ බලතල විභාග දෙපාර්තමේන්තුව සතුවන අතර, මෙහිදී ගැටලුවට මුහුණදුන් සිසුවාගේ සහ දෙමාපියන්ගේ ක්‍රියාකලාපයන් ද, විදුහල්පතිතුමියගේ ක්‍රියාකලාපය ද පිළිබඳ

වැඩිදුර පරීක්ෂා කර නිර්දේශ ඉදිරිපත් කිරීම හෝ ක්‍රියාමාර්ග ගැනීම විභාග දෙපාර්තමේන්තුව මගින් සිදුකරන බවත්, පාසල් අධීක්ෂණය තුළින් හඳුනාගත් තත්ත්වයන් සම්බන්ධව අධීක්ෂණ කමිටුවේ නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව එම වාර්තාවෙහි සඳහන් කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාසල් කටයුතු) ගේ ප්‍රධානත්වයෙන් 2024.08.02 දින මාර/රාහුල විද්‍යාලයේදී සිදුකරන ලද අධීක්ෂණය ඔස්සේ රාහුල විදුහලේ මුරකරු වෙතින් ලබාගත් ප්‍රකාශ සටහන් පහත පරිදි වේ.

01. එම්. ඩබ්. රවී ප්‍රේමරත්න මයා - පාසල් මුරකරු (රාහුල විද්‍යාලය)

2024.05.06 දින තමා පෙ.ව. 6.00 පමණ රාජකාරි කටයුතු සඳහා වාර්තා කළ බවත් එදින තමා සමග තවත් රජයේ මුරකරු සේවයේ නිලධාරියෙක් සහ පුද්ගලික අංශයේ මුරකරුවෙක් ද රාජකාරී කළ බව සඳහන් කර ඇත. එදින උදෑසන පාසල තුළට දරුවන් ඇතුළු කිරීමේදී එක් දරුවෙක් සමග එම දරුවාගේ දෙමව්පියන් ද පාසල තුළට ඇතුළුවීමට උත්සාහදැරීම හේතුවෙන් ඇතිවූ ප්‍රශ්නයක් තමා විසින් තමා සමග රාජකාරියේ නියුතුව සිටි අනෙක් මුරකරු සමග අදාළ ශිෂ්‍යයා විභාග ශාලාවට යාමට කටයුතු සලසාදුන් බවත්, දරුවා පාසලට ඇතුළු කිරීමේදී එම දෙමාපියන් අවසර පත්‍රයක් රැගෙන පැමිණ සිටි බවට තමා පූර්ව දැනුවත් භාවයකින් නොසිටි බවත් ප්‍රකාශ කර ඇත. පසුව ශාලාධිපති සහ සම්බන්ධීකරන නිලධාරී මහතා දැනුවත් කළ බවත් ඉන් අනතුරුව රාහුල විදුහලේ විදුහල්පතිතුමිය දැනුවත් කර එම ප්‍රශ්නය විදුහල්පතිතුමිය විසින් කතා කර විසඳීමට කටයුතු කළ බවත් මුරකරු විසින් ප්‍රකාශ කර ඇත. තවද එම අවස්ථාවේදී දරුවාගේ දෙමව්පියන් නොසන්සුන් ආකාරයෙන් හැසිරීමට පියවර ගත් බවත් එය විසඳීමට විදුහල්පතිතුමිය පියවර ගත් බවත් වැඩිදුරටත් මුරකරු විසින් ප්‍රකාශ කර ඇත.

නිරීක්ෂණ :

01. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් විභාගය සඳහා යොමු කිරීමේදී සිදුකරනු ලබන සාමාන්‍ය ක්‍රියාවලිය අනුව විභාගය පැවැත්වීමට මාස කිහිපයකට පෙර පාසලේ විදුහල්පති විසින් විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයින් සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව වෙත ලිඛිතව දැනුම්දීමක් සිදුකර ඉල්ලීම සිදුකරන බව විභාග දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශ කර ඇත. ඒ අනුව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2024.08.15 දිනැතිව ED/1/6/12/HRC/2024/19 යොමු අංක යටතේ කොමිෂන් සභාව වෙත යොමුකරන ලද ගොනුවෙහි, 2024.04.16 දිනැතිව රාහුල විද්‍යාලයේ විදුහල්පති සමිත කුරුකුලසූරිය මිය විසින් විභාග කොමසාරිස් ජනරාල් වෙත "විශේෂ අවශ්‍යතා සහිත අයදුම්කරුවන් සඳහා සහන සැලසීම" යන මැයෙන් වදුල් ලක්විද ශිෂ්‍යයා විශේෂ අවශ්‍යතා සහිත දරුවෙක් බව සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් යොමුකර ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව මෙම ශිෂ්‍යයා විශේෂ අවශ්‍යතා සහිත දරුවෙක් බව සහ විභාග

අවස්ථාවේදී විශේෂ සහනයක් මෙම දරුවාට ලබාදිය යුතු බවට විදුහල්පතිනිය පූර්ව දැනුවත්භාවයකින් සිට ඇති බවට නිරීක්ෂණ වේ.

02. ඉහත ලිපි ගොනුවෙහිම 2024.07.02 දිනැතිව රාහුල විද්‍යාලයේ නියෝජ්‍ය විදුහල්පති ඩී. ටී. ඒකනායක මිය විසින් මානව හිමිකම් කොමිෂන් සභාවේ මාතර කාර්යාලය වෙත ලිපියක් යොමුකරමින්, විභාග දෙපාර්තමේන්තුව විසින් වදූල් ලක්විද ජයසිංහ - විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති අයදුම්කරුවන්ට පහසුකම් සැපයීම නැමති ලිපිය 2024.04.29 දින පාසලට ලැබුණු බවත් එම ලිපිය එදිනම අදාළ දරුවාගේ මව වෙත ලබාදුන් බවට සහතික කර ලිපියක් යොමුකර ඇත. ඒ අනුව විභාගය පැවැත්වෙන දින මෙම දරුවාහට විභාග ශාලාවේදී පහසුකම් සැපයීමට නිර්දේශවී ඇති බව සහ එම පහසුකම් මොනවාද යන්න පිළිබඳව පාසල් බලධාරීන් පූර්ව දැනුවත්භාවයකින් සිට ඇති බවට නිරීක්ෂණය වේ.

03. 2024.05.06 දින සිදුවූ මෙම සිදුවීම සම්බන්ධයෙන් පැමිණිලිකරු ලබාදුන් ප්‍රකාශයෙහි සිය දරුවා සමග පාසලට ඇතුළුවීම සඳහා ලබාදුන් අවසර ලිපිය තමා පාසලේ මුරකරුට වෙත ඉදිරිපත් කළ බව සඳහන් කර ඇත. එහෙත් මුරකරු විසින් ප්‍රකාශ කර ඇත්තේ එවැනි අවසර ලිපියක් පැමිණිලිකාරිය විසින් තමා වෙත ඉදිරිපත් නොකළ බවයි. මෙ සම්බන්ධයෙන් ශාලාධිපති විසින් ලබාදෙන ලද ප්‍රකාශයෙහි, "මෙම විශේෂ අවශ්‍යතා සහිත දරුවා විභාගයට පෙනී සිටින බවට ගේට්ටු මුරකරුට දන්වා ඇති බවත්, මෙම ලිපියේ පිටපතක් විභාග දෙපාර්තමේන්තුව විසින් දෙමව්පියන්ට ද ලබාදී ඇත. තමා පමණක් නොව විභාග සම්බන්ධීකරණ කටයුතු නිලධාරියා විසින් ද මුරකරු වෙත විශේෂ අවශ්‍යතා සහිත දරුවෙකු විභාගයට පෙනී සිටීමට පැමිණෙන බව දැනුවත් කර ඇත" යනුවෙන් සඳහන් කර ඇත. ඒ අනුව පාසලේ මුරකරු විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදී ඇති ප්‍රකාශය චේතනාන්විතව වැරදි සහගත ලෙස ලබාදී ඇති බවත්, මෙම දරුවා සම්බන්ධයෙන් පූර්ව දැනුවත්වීමක් සහිතව සිට ඇති නමුත් නීත්‍යානුකූල ආකාරයෙන් කටයුතු කර නොමැති බවත් කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

04. එමෙන්ම මුරකරුගේ ප්‍රකාශයෙහි ඔහු විසින් මෙම ගැටලුව සම්බන්ධයෙන් ශාලාධිපති සහ සම්බන්ධීකරණ නිලධාරී මහතා දැනුවත් කළ පසු ශාලාධිපති එම ස්ථානයට පැමිණි බව ප්‍රකාශ කර ඇති නමුත්, ශාලාධිපතිගේ ප්‍රකාශයෙහි සඳහන්ව ඇත්තේ, "විශේෂ අවශ්‍යතා සහිත දරුවකුගේ දෙමාපියන්ට පාසලට ඇතුලුවීමට අවසර නොදීම සම්බන්ධයෙන් කලාප කාර්යාලයෙන් ලද දැනුම්දීමකට අනුව තමා පාසලේ ගේට්ටුව අසලට" ගිය බවයි. ඒ අනුව මුරකරු විසින් දිගින් දිගටම මෙම සිදුවීම සම්බන්ධයෙන් නිවැරදි තොරතුරු ලබාදී නොමැති බව නිරීක්ෂණය වන බැවින් මෙකී සිදුවීම සම්බන්ධයෙන් මුරකරු විසින් ලබාදී ඇති ප්‍රකාශයෙහි අඩංගු තොරතුරු සත්‍ය තොරතුරු බවට පිළිගත නොහැකි බවට කොමිෂන් සභාවට පෙනීයයි.

05. මෙම සිදුවීමේදී විදුහල්පතිනිය විසින් දෙමව්පියන් වෙත බැන තරුජනය කළ බවට පැමිණිලිකරු සඳහන් කර ඇත. එම සිදුවීම සම්බන්ධයෙන් ශාලාධිපති ලබාදී ඇති ප්‍රකාශයෙහි ද, "එම අවස්ථාවේදී

යම් කාන්තාවක් සහ පිරිමි පුද්ගලයෙකු සමග රාහුල විද්‍යාලයේ විදුහල්පතිතුමිය බහින්බස්වීමක් සිදුවන බව තමාට නිරීක්ෂණය වූ බවත්, මෙම ගැටලුව විශේෂ අවශ්‍යතා ඇති දරුවා සම්බන්ධ ගැටලුව බව තමාට පැහැදිලි වූ බවත්" ශාලාධිපති ප්‍රකාශ කර ඇත. ඒ අනුව විදුහල්පතිනිය විසින් චේතනාන්විතව මෙම අවස්ථාවේදී නීත්‍යානුකූලභාවයකින් තොරව කටයුතු කළ ඇති බවට නිරීක්ෂණය වේ.

06. එපමණක් නොව මෙම අවස්ථාවේදී විදුහල්පතිතුමිය ශාලාධිපති සමග ද බහින්බස්වීමක් සිදු වූ බව ශාලාධිපති විසින් ප්‍රකාශ කර ඇති අතර පැමිණිකරුවන් විසින් ද ඒ පිළිබඳව සඳහන් කර තිබේ. එමෙන්ම ශාලාධිපති විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, "ආබාධිත දරුවාගේ දෙමාපියන්ට විභාග මධ්‍යස්ථානයට ඇතුළුවීමට ඉඩනොදීම සහ විදුහල්පතිනිය විසින් විභාග කොමසාරිස් ජනරාල් මගින් 2024.04.30 දිනැතිව නිකුත් කරන ලද ලිපියට අනුව ක්‍රියා නොකිරීම හේතුවෙන් තමාගේ කාර්යය භාරයට අනවශ්‍ය මැදිහත්වීමක් සිදුකළ බවත්, එමගින් මෙම දරුවාගේ දෙමව්පියන්ට අසාධාරණයක් සිදුවූ බවයි." පැමිණිලි පාර්ශවය විසින් මෙම සිදුවීම සනාථ කිරීමස සඳහා වීඩියෝ පටයක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එම වීඩියෝ දර්ශන නිරීක්ෂණය කිරීමේදී ඉහත 04 සහ 05 යටතේ දක්වා ඇති කරුණු තවදුරටත් තහවුරු වන බව කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ. ඒ අනුව 01 වන වගඋත්තරකරු වන සමිත කුරුකුලසූරිය විදුහල්පති (රාහුල විද්‍යාලය) විසින් විභාග මධ්‍යස්ථානයේදී ශාලාධිපතිවරයෙකු සතු බලත අභිබවනය කර ඇති බවත් නීත්‍යානුකූල රාමුවෙන් පරිභාහිරව කටයුතු කර ඇති බවට කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

නිගමනය :

මෙම සිදුවීමට අදාළ සියලුම සාක්ෂි කොමිෂන් සභාව විසින් විමර්ශනයට ලක්කරන ලදි. ඒ අනුව 1968 අංක 25 දරණ පොදු විභාග පනතෙහි සඳහන් බලතල ප්‍රකාරව විභාග සම්බන්ධයෙන් සහ විභාග මධයස්ථාන සම්බන්ධයෙන් පූර්ණ බලයලත් නිලධාරියා විභාග කොමසාරිස් ජනරාල්වරයා වේ. එම බලතල අනුව විභාග කොමසාරිස් විසින් ශාලාධිපති වෙත පවරා දී ඇති බැවින් විභාග ශාලා පරිශ්‍රයක් තුළ ක්‍රියාත්මක වනුයේ විභාග ශාලාධිපතිගේ බලතල පමණි. එහෙත් මෙම පැමිණිල්ලට අදාළ සිදුවීමේදී 01 වන වගඋත්තරකරු වන සමිත කුරුකුලසූරිය විදුහල්පති (රාහුල විද්‍යාලය) විසින් විභාග මධ්‍යස්ථානයේදී ශාලාධිපතිවරයෙකු සතු බලත අභිබවනය කර ඇති බවත් නීත්‍යානුකූල රාමුවෙන් පරිභාහිරව කටයුතු කර ඇති බවත් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලබයි.

එමෙන්ම විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව විශේෂ චක්‍රලේක, විධිවිධාන, මාර්ගෝපදේශ නිකුත්කර තිබිය දී, විභාගයකට මුහුණදීමට යන මෙම විශේෂ අවශ්‍යතා සහිත ශිෂ්‍යයා මානසික පීඩනයට පත්වන ආකාරයෙන් කටයුතු කර ඇති බව ද කොමිෂන් සභාවට නිරීක්ෂණය වේ.

ඒ අනුව විභාග කොමසාරිස් ජනරාල් විසින් විශේෂ ලිඛිත අවසරයක් දෙමාපියන් වෙත ලබාදී තිබියදී සහ ඒ පිළිබඳව දැනුවත්ව සිටි පසුබිමක විදුහල්පතිනිය විසින් සිදුකරන ලද මෙම ක්‍රියාව හේතුවෙන් අගතියට පත් වදුල් ලක්විද ජයසිංහ ශිෂ්‍යයාගේ සම්බන්ධයෙන්, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති "නීතිය පසිදලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුත්තේය" යන මූලික අයිතිවාසිකම පළමුවන වගඋත්තරකරු වන සමිත කුරුකුලසූරිය විදුහල්පති (රාහුල විද්‍යාලය) විසින් උල්ලංඝනය කර ඇති බවට කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබේ.

එමෙන්ම 1989 නොවැම්බර් මස 20 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද "ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියෙහි" (Convention on the Rights of the Child) පාර්ශවකරුවෙකු ලෙස 1991 වසරේදී ශ්‍රී ලංකාව අත්සන් තබා ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට නෛතිකමය වශයෙන් බැඳී සිටී.

තවද, 1996 අංක 28 දරණ "ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත" මගින් සහ 2016 පෙබරවාරි මස 08 වන දින "ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට" (United Nations Convention on the Rights of Persons with Disabilities) ශ්‍රී ලංකාව අත්සන් තබමින් විශේෂ අවශ්‍යතා සහිත ප්‍රජාවගේ අයිතීන් සුරක්ෂිත කිරීමේ නෛතික රාමුව තුළ බැඳී සිටී.

ශ්‍රී ලංකාව තුළ දරුවන් සම්බන්ධයෙන් එවැනි සුවිශේෂී නීතිමය රාමුවක් පවතින පසුබිමක සහ අධ්‍යාපනය ලබන දරුවන්ට, සෑම දරුවෙක්ටම සමාජ ගරුත්වයක් සහ අයිතිවාසිකම් පවතින බව ඉගැන්විය යුතු හා එමෙන්ම ආදර්ශවත් විය යුතු විදුහල්පතිනියක් වශයෙන් හා රජයේ වගකිවයුතු නිලධාරියෙකු වශයෙන් 01 වන වගඋත්තරකරු වන සමිත කුරුකුලසූරිය (විදුහල්පති - රාහුල විද්‍යාලය) මිය විසින්, මෙකී සම්මුතීන් නොසලකාහරිමින් අගතියටපත් වදුල් ලක්විද ජයසිංහ ශිෂ්‍යයාගේ ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති 12 (1) ව්‍යවස්ථාවේ සඳහන් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බවට මෙයින් නිගමනය කරනු ලැබේ.

ඉහත නිගමන අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාව සහ එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, 1996 අංක 28 දරණ ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත සහ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය යන නීති උල්ලංඝනය වන ආකාරයෙන් 01 වන වගඋත්තරකරු විසින් කටයුතු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පහත පරිදි නිර්දේශ කර සිටී.

ලේකම් (අධ්‍යාපන අමාත්‍යාංශය) සහ විභාග කොමසාරිස් ජනරාල් විසින්,

1. පළමු වන වගඋත්තරකරු සමිත කුරුකුලසූරිය (විදුහල්පති - රාහුල විද්‍යාලය) මිය සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

2. රාහුල විද්‍යාලයේ පාසල් මුරකරු වශයෙන් සේවය කරනු ලබන එම්. ඩබ්. රවී ප්‍රේමනාත් මයා මෙම පැමිණිල්ලට අදාළව නිවැරදි සාක්ෂි ලබානොදීම සම්බන්ධයෙන් සුදුසු විනයානුකූල පියවර ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව කොමිෂන් සභාව දැනුවත් කළ යුතු ය.

2024. 10 . 30 වන දිනට පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්ති ප්‍රකාරව වගඋත්තර පාර්ශවය වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති.

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත්

01. අමාත්‍යතුමා - කා.දැ.ගැ.ද
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

2. ලේකම - ඉහත නිර්දේශ ප්‍රකාරව පියවර ගැනීම
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.